www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තායිලන්ත විරෝධතාවන්ගේ දේශපාලන පාඩම්

## The political lessons of the Thai protests

**පීටර් සිමන්ඩ්ස්**

**2010 මැයි 27**

පසුගිය සතියේ හමුදා කඩාපැනීම් මගින් බැංකොක් වීදිවල ආන්ඩු විරෝධී විරෝධතා ව්‍යාපාර තලා දැමීමට සමත් වුවත්, යටපත්ව පවතින සමාජ ආතතීන් හා දේශපාලන ගැටලු එලෙසම පවත්නා අතර ඒවා ක්ෂනිකව හෝ කල්පසුවී නව රූපාකාරවලින් නියත ලෙසම මතුවී එනු ඇත.

තායි පාලක පන්තියේ සිව් වසරක උග්‍ර ආරාවුල්වලින් අනතුරුව හිටපු අගමැති තක්සින් සිනවත්‍රාගේ ආධාරකරුවන් ඔවුන්ගේ පාර්ශවීය විරුද්ධවාදීන්, අගමැති අභිසිත් වෙජ්ජජීවාට එරෙහිව පෙරලා පහර දීමට මාර්තු මැදභාගයේදී විරෝධතා කැඳවුම් කලේය. කෙසේවෙතත්, දේශපාලන සංස්ථාපිතයේ දරුනු විභේදනයන්, රටේ ග්‍රාමීය උතුර සහ ඊසාන දෙසින් පැමිනි විරෝධතාකරුවන් පෙරමුන ගත් පලල් විරෝධතා ව්‍යාපාරයකට දොර විවර කලේය.

විරෝධතා අඛන්ඩව පවතිද්දී, ගොවියන්, වෙලෙන්ඳන් සහ සුලු ව්‍යාපාරිකයින් තමන්ගේම හඬක් සොයා ගැනීමට පටන් ගත්හ. "රතු කමිස" විරෝධතාකරුවන් තමන්ගේ ජීවිත සහ බැංකොක් වානිජ්‍ය මධ්‍යස්ථානයේ සේවයේ නියුතු සහ සාප්පු සංකීර්නයේ සාප්පු සවාරියේ යන ධනවතුන් අතර පරතරය දෙසට අවධානය යොමු කලහ. ඔවුහු තමන්ගේ වීරයා යැයි සාවද්‍ය ලෙස අදහා ඡන්දය ප්‍රකාශ කල තක්සින් බලයෙන් පහකල හමුදාව, රාජ්‍ය නිලධරය හා රාජාන්ඩුවාදීන්ගෙන් සැදුම් ලත් තායිලන්තයේ සාම්ප්‍රදායික ප්‍රභූ පෙලැන්තියට තමන්ගේ සතුරුකම ප්‍රකාශ කලහ.

මෙම විරෝධතාකරුවෝ දැඩි අධිෂ්ඨානය හා ධෛර්යය විදහා දැක්වීය. අප්‍රේල් 10 වෙනි දින විරෝධතා පැවති ප්‍රදේශය හිස්කිරීමට පැමිනි සොල්දාදුවන් ඔවුන් විසින් ආපසු හරවා යැවුවේ ගල්ප්‍රහාර සහ පෙට්‍රල් බෝම්බ වැනි දේ යොදාගනිමිනි. හමුදාව විසින් සියලුම සැපයුම් අත්හිටුවා අවසන් ගැටුම සඳහා භට කන්ඩායම් හා සන්නද්ධ රථ වලින් විරෝධතාකරුවන් වටලනු ලබද්දී හා ජීවිත හානි වැඩි වෙද්දී දහස් ගනනක් එහිම රැඳී සිටියහ. හමුදාව පරිශ්‍රය තුලට ගමනාරම්භ කරන විට විරෝධතා කන්ඩායම් යටත් වූ "රතු කමිස" නායකයින් ප්‍රතික්ෂේප කල අතර ධනයේ සහ වරප්‍රසාදවල සංකේත ලෙස සැලකූ ගොඩනැගිලි වලට ගිනි තැබූහ. කෙසේ වෙතත්, ව්‍යාපාරයේ තීරනාත්මක දුර්වලතාව, එනම් එහි අවශ්‍යතා ඉස්මත්තට ගෙන යාමට වැඩපිලිවෙලක් සහ ඉදිරිදර්ශනයක් නොමැතිකම විසිරයාම මගින් ප්‍රදර්ශනය කලා පමනි.

බැංකොක් නගරයේ සිද්ධීන්, සියවසකටත් පෙරාතුව ලියොන් ට්‍රොට්ස්කි විසින් විස්තාරනය කරන ලද නොනවතින විප්ලව න්‍යායේ මූලික පාඩම්වල සිත්කාවදින සනාථ වීමකි. රුසියාවේ 1905 විප්ලවයේ අත්දැකීම් මත පාදක වෙමින් ට්‍රොට්ස්කි, දුරදිග යන නිගමන උකහා ගත්තේය: පලමුව, ගොවීන්ගේ අවශ්‍යතාවලට විසඳුම් දීමට හෝ ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් උදෙසා සැබෑ අරගලයක් මෙහෙයවීමෙහිලා පසුගාමී ධනපති රටවල ධනේශ්වරය ඓන්ද්‍රීයවම අසමත් බව; දෙවනුව, ස්වාධීන දේශපාලන භූමිකාවක් ඉටු කිරීමට ගොවිජනයාට නොහැකි බවත් ඔවුන් නියත ලෙසම ධනපති පන්තිය හෝ කම්කරු පන්තිය අනුයනු ඇති බව; තෙවැනුව, සාර්ට එරෙහිව අරගලයේදී ගොවිජනතාවට නායකත්වය දිය හැකි එකම සමාජ බලවේගය නිර්ධන පන්තිය වන බවත් ය. කම්කරු පන්තිය බලය හිමිකර ගනිමින් ලෝක සමාජවාදී විප්ලවයේ අභේද්‍ය සංරචකයක් වසයෙන් පෞද්ගලික දේපල අහෝසි කිරීමට යොමුවෙනු ඇත. ඔක්තෝබර් විප්ලවය සහ ලෝකයේ ප්‍රථම කම්කරු රාජ්‍ය රුසියාවේදී උත්පාදනය කල 1917 වර්ෂය තුල [නොනවතින විප්ලව] න්‍යාය එහි පලමු සහ වඩාත් තීරනාත්මක පරීක්ෂනය සමත් වූවේය.

පසුගිය සියවසක කාලයේදී බොහෝ දේවල් වෙනස් වී තිබේ, එහෙත් මූලික පන්ති ගතිකයන් යල් පැනගිය ලාභ පද්ධතිය යටතේ එලෙසම නොනැසී පවතී. කම්කරු පන්තියේ දේශපාලනිකව සවිඥ්ඥානික ව්‍යාපාරයක් නොමැති වීමෙන්, ගොවියන්, සුලු දේපල හිමියන් සහ ග්‍රාමීය දිලින්ඳන් තක්සින් සහ ඔහුගේ "ආඥාදායත්වයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදය සඳහා එක්සත්

පෙරමුනේ" (යූඩීඒ) ධජය යටතේ බැංකොක්වලට ඒකරාශී වූහ. "ප්‍රජාතාන්ත්‍රවාදය" පිලිබඳ ඔහුගේ වාචාල දෙඩවීම් මගින් තක්සින් අරමුනු කලේ වේලාසන මැතිවරනවලට සීමා පැනවීමටත් ඔහුගේ අවශ්‍යතාවන්ට වඩාත් හිතකර ආන්ඩුවකුත්ය. ඔහු බලයේ සිටියදී මාධ්‍යවේදීන්ට එල්ල කෙරුනු තර්ජනය කිරීම්, දකුනේ ඉස්ලාමීය බෙදුම්වාදීන්ට එරෙහිව උත්සන්න කෙරුන මිලිටරි මෙහෙයුම් සහ ඔහුගේ "මත්ද්‍රව්‍යවලට එරෙහි යුද්ධයේදී" සිදුකල සියගනනක් නීතිවිරෝධී ඝාතන වලින් ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් කෙරෙහි ඔහුගේ පිලිකුල තක්සින් යලි යලිත් ප්‍රදර්ශනය කර ඇත.

තවද, ඔක්ස්ෆර්ඩ්හි අධ්‍යාපනය ලැබූ අභිසිත්ට වඩා වෙනස් ලෙස තායිලන්තයේ ගැමි ජනතාව මුහුන දී සිටින ගැඹුරුවන සමාජ අර්බුදය විසඳීමේ හැකියාවක් ටෙලිකොම් බිලියනපතියෙකු වන තක්සින්ට ඇත්තේ නැත. තක්සින්ගේ සීමිත සහනාධාර සහ ලාභ සෞඛ්‍ය ආරක්ෂනය වූ කලී 1997-98 ව්‍යසනකාරී ආසියානු මූල්‍ය අර්බුදයෙන් ගොඩ ඒමේදී තායි ආර්ථිකය උත්තේජනය කිරීමට ඔහුගේ ආන්ඩුව දැරූ පරිශ්‍රමයේ කොටසකි. තක්සින් හා යූඩීඩී නායකයින්, සුලු ව්‍යාපාරිකයින් හා ගොවීන් මුහුන දෙන නයගැතිභාවයේ හා මූල්‍ය අවිනිශ්චිතතාවයේ මූල හේතුව වන ධනවාදී පද්ධතිය වෙනුවෙන් කැපවූ ආරක්ෂකයෝ වෙති. පෙර දැකිය හැකි වූ පරිදිම, විරෝධතා වඩාත් පුලුල් වෙත්ම, යූඩීඩීය යටත් වූ අතර රාජ්‍ය යන්ත්‍රය සමග මුහුනට මුහුන ගැටීම උත්සන්න වෙත්ම විරෝධතා අත්හැර දැමුවේය.

එමෙන්ම, විවිධාකාර විරෝධතාකරුවන් ප්‍රකාශයට පත් කල සමාජයීය දුක් දොම්නස් කිසිම විටෙක දේශපාලන වැඩපිලිවෙලකට සූත්‍රගත කෙරුනේ නැත. ඔවුන්ට එසේ කිරීමේ හැකියාවක් තිබුනේ ද නැත. ට්‍රොට්ස්කි විස්තර කල ආකාරයට, ගොවිජනතාව සමජාතීය පන්තියක් නොවේ. එහි පහල තට්ටු ගම්බද නිර්ධන පන්තිය සමග එක්වන අතර එහි ඉහල තට්ටු ධනපති පන්තියට බැඳී සිටී. ධනවාදයේ වර්ධනය සමග ප්‍රසාරනය වන කම්කරු පන්තියට වෙනස් ලෙස සුලු ධනේශ්වරයේ මෙම පන්තිය දීර්ඝ වකවානුවක් තුල සිදුවූ වැඩි දුර ආර්ථික සංවර්ධනය තුලින් ව්‍යසනයට ඇද දමා තිබේ. තායිලන්තයේ කෘෂි කර්මාන්තයේ යෙදෙන ජනගහන ප්‍රතිශතය සමස්ත ශ්‍රම බලකායෙන් 1980 සියයට 70වේ සිට අද වනවිට සියයට 40 දක්වා පහත වැටී ඇත.

ඔවුන්ගේ පීඩිතභාවයේ මූල බීජය වන ලාභ පද්ධතිය අහෝසි කිරීමෙන් ද මූල්‍ය හා තාක්ෂනික ආධාර සැපයීමෙන් ද ගම්බද මහජනයාට උපකාර කල හැක්කේ කම්කරු පන්තියටම පමනි. තායිලන්තයේ මෑතම සිදුවීම්වලදී කම්කරු පන්තිය ස්වාධීන කාර්යභාරයක් ඉෂ්ට කලේ නැත. කම්කරුවන් සහභාගි වී නම් ඒ යූඩීඩී ධජය යටතේ පුද්ගල මට්ටමෙන් සිදුවූවකි. මාක්ස්වාදයේ විරුද්ධවාදීන් මෙය කම්කරු පන්තිය විප්ලවවාදී පන්තියක් නොවේය යන්නට වැඩිදුර සාක්ෂියක් වසයෙන් නිසැකවම උපුටා දක්වනු ඇත. එහෙත් කම්කරු පන්තිය සූරාකැවෙන ජනතාවකගේ සිට විප්ලවවාදී සමාජ බලයක් බවට පරිවර්තනය කිරීම, සියල්ලටමත් ඉහලින්, එහි පන්ති අවශ්‍යතා පිලිබඳ සවිඥ්ඥානකත්වයක් ඉල්ලා සිටින අතර එය අධ්‍යාපන ගත කරන, සංවිධානය කරන හා සටනට මෙහෙයවන පක්ෂයකින් තොරව එය කල නොහැක. තායිලන්තයේ එවැනි පක්ෂයක් නොපැවතීම දීර්ඝ කාලයක සිට පැවතෙන ස්ටැලින්වාදයේ පාවාදීම් සහ දැන් පෙරලා දැමිය යුතු එහි ක්ෂමාලාපකයින්ගෙන් උරුම වූවකි.

සෝවියට් සංගමයේ කම්කරු පන්තියෙන් බලය ඩැහැගත් ස්ටැලින්වාදී නිලධාරී තන්ත්‍රය "තනි රටේ සමාජවාදයේ" ප්‍රතිගාමී වැඩපිලිවෙල හුවාදැක්වූ අතර ට්‍රොට්ස්කි සහ සමාජවාදී ජාත්‍යන්තරවාදය ප්‍රතික්ෂේප කලේය. ආසියාවේදී ස්ටැලින්, ජාතික ධනපති පන්තියට ප්‍රගතිශීලී භූමිකාවක් පවරන ලද අපකීර්තිමත් අවධි දෙකේ න්‍යාය යලි පන ගැන්වූ අතර එය, 1925-27 චීන විප්ලවයට විනාශකාරී ප්‍රතිවිපාක ගෙන දුන්නේය. ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවය නින්දා අපහාස හා මුසාවාද කන්දක් යට වලලන අතරේ මාවෝ සේතුංගේ නිසරු ගොවි රැඩිකල්වාදය මාක්ස්වාදය වසයෙන්ද ගරිල්ලා සංග්‍රාමය තායිලන්තය වැනි රටවල් සඳහා ඉදිරි මාවත ලෙසද හඳුන්වා දුන්නේය.

මාවෝගේ දේශපාලන පොල්මෑකරුවන් ලෝක ධනවාදයේ ලාභ ශ්‍රම කම්හල බවට පරිවර්තනය කල චීනයේ දී මාවෝගේ බංකොලොත්භාවය සියල්ලට ඉහලින් එහි "සාර්ථකත්වය" තුලින් ප්‍රදර්ශනය කර තිබේ. මාවෝවාදී ගරිල්ලා ව්‍යාපෘතිවල දේශපාලන නටඹුන් පිලිබඳ සාක්ෂි සමස්ත කලාපය පුරාම දැකිය හැකිය. තායිලන්තයේදී, දැන් කුනු කූඩයට තල්ලු වී ඇති කොමියුනිස්ට් පක්ෂය 1960 ගනන්වලදී ගරිල්ලා යුදකෙලියට සම්ප්‍රාප්ත විනි. 1976 තමාසට් විශ්ව විද්‍යාලයේ සිදුවූ ම්ලේච්ඡ සංහාරයෙන් කූටප්‍රාප්තියට පත් 1970 ගනන්වල දේශපාලනික කලබැගෑනි වලින් රැඩිකලීකරනයවූ සිසුන් හැරුනේ කම්කරු පන්තිය වෙත නොව, ගම්බද දෙසට යි. මුලා නොවූ බොහෝ දෙනෙක් ආපසු හැරී ආහ. පසුගිය වසරේ මාවෝවාදීන් අද දින යූඩීඩී සහ එහි විරුද්ධවාදීන් යන දෙගොල්ලගේම "වාම" උපදේශකයන් වසයෙන් තායි දේශපාලන සංස්ථාපිතයට උකහා ගෙන තිබේ.

ලෝකයේ අනෙක් ප්‍රදේශ මෙන්ම, තායිලන්තය ද ගෝලීය ධනවාදී අර්බුදය මගින් ඇති

කල විප්ලවවාදී හැල හැප්පීම්වල නව කාල පරිච්ඡේදයක් තුලට කඩාවදිමින් තිබේ. බැංකොක් විරෝධතා තායිලන්තයේත් ජාත්‍යන්තරවත් කම්කරු පන්තිය නියත ලෙසම අරගලය වෙතට ඇද දමන සිද්ධීන්වල මං සලකුනකි. ආසියාවේ අනෙකුත් පෙදෙස්වල, විසිවන සියවසට එලැඹීමේදී බාල වියේ සිටි නිර්ධන පන්තිය එහි ප්‍රමානයෙන් දැවැන්තව වැඩී ඇති අතරම ගෝලීය නිෂ්පාදන සන්තතියට ඒකාග්‍රවී සිටී. ගෝලීය ප්‍රාග්ධනය විසින් ලොව 10 වෙනි විශාලතම වාහන අපනයනකරුවා බවට තායිලන්තය පරිවර්තනය කර ඇත. වාහන ක්ෂේත්‍රයේ නියැලි තායිලන්ත කම්කරුවන් සංඛ්‍යාව 400,000ක් පමන වෙයි.

ඉදිරි අරගලවලදී කම්කරු පන්තිය මෙහෙයවීමට සමත්වන සමාජවාදී ජාත්‍යන්තරවාදයේ වැඩපිලිවෙල මත පදනම් වූ දේශපාලන පක්ෂයක් ගොඩනැගීම තායිලන්තයේ කම්කරුවන් හා තරුන ජනයා මුහුන දී සිටින අභියෝගයයි. සියල්ලටමත් ඉහලින්, ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය සහ විසිවන ශතවර්ෂයේ තායි මෙන්ම ජාත්‍යන්තර කම්කරු පන්තියේ ප්‍රධාන මූලෝපායාත්මක අත්දැකීම් ස්වීකරනය කරගැනීම එය විසින් ඉල්ලා සිටියි. එය කල හැකි වන්නේ ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ - හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට ඒකාග්‍රවූ කොටසක් වසයෙන් ම පමනි.

© www.wsws.org